# 22 යහපත් දේ අයදිමු

මෙලොව උත්පත්තිය ලබා ප්‍රසාද ස්නාපනය මගින් කතෝලිකයන් වන සෑම කෙනෙකු ම ජීවිත දෙකකට හිමිකම් කියයි. එනම්, ලෞකික ජීවිතය සහ සදාතනික ජීවිතයයි. ලෞකික ජීවිතය කෙටිකාලීන වුවත් සදාතනික ජීවිතය සදාකාලික වේ. සදාතන ජීවිතය අත්කර ගැනීමට ලෞකික ජීවිතය තුළ පින් කුසල් රැස්කර ගත යුතු ය. එදිනෙදා ජීවිතයේ දී මෙන් ම අප යාච්ඤා කරන විට තමාගේ මෙන් ම අන් අයගේ යහපත වෙනුවෙන් යාච්ඤා කිරීමට යොමු විය යුතු ය. ශුද්ධ බයිබලයේ ද යහපත් දේ අයදීම පිළිබඳ ව උගන්වයි.

## සලමොන් රජතුමාගේ යාච්ඤාව



22.1 රූපය - සලමොන් රජතුමා

ගිබියොන්හි දී සමිඳාණන් වහන්සේ රාත්‍රියේ දී ස්වප්නයකින් සලමොන් රජතුමාට දර්ශනය වී, "මා නුඹට දිය යුතු දෙය ඉල්ලන්නැ"යි වදාළ සේක. සලමොන් රජතුමා කතා කොට, මෙසේ ඉල්ලී ය; "ඔබේ මේ සෙනඟ විනිශ්චය කරන පිණිස, හොඳ නරක දැනගන්න පුළුවන් වන ලෙස ඥානවන්ත සිතක් ඔබේ දාසයාට දුන මැනව" (1 රාජාවලිය 3:9). සලමොන් රජතුමා මේ දේ ඉල්ලූ නිසා දෙවියන් වහන්සේ ඊට ප්‍රසන්න වූ සේක. තියුණු නැණ නුවණ ද ධනය ද ගෞරවය ද සලමොන් රජතුමාට ලැබෙන බව දැන්වූ සේක.

අයහපතින් යහපත හඳුනා ගැනීමේ වරම ද තමන්ට ගැළපෙන දේ තෝරා ගැනීමට ශක්තිය ද දානය කරන ලෙස දෙවියන් වහන්සේගෙන් ඉල්ලා යාච්ඤා කිරීම වැදගත් වන බව මෙයින් සනාථ කරයි. එසේ ම දෙවියන් වහන්සේගෙන් ඈත් ව හුදකලා වූ විට දුර්විපාක අත්වන බව ද මතක් කර දෙයි. මිනිසෙකු පාපයෙන් ඈත් වන විට ඔහුගේ අවැසිතා සියල්ල දෙවියන් වහන්සේ ලබා දෙන බව මෙයින් අපට උගන්වයි.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

"ඉල්ලන්න, ඔබට දෙනු ලැබේ; සොයන්න, ඔබට සම්බ වේ; තට්ටු කරන්න, ඔබට දොර අරිනු ලැබේ. මන්ද, ඉල්ලන්නාට ලැබේ; සොයන්නාට සම්බ වේ; තට්ටු කරන්නාට දොර අරිනු ලැබේ. ඔබ අතරින් කවර මනුෂ්‍යයෙක් හෝ තමාගේ පුත්‍රයා පාන් ගෙඩියක් ඉල්ලුවොත්, ඔහුට ගල් ගෙඩියක් දෙයි ද? මාළුවෙකු ඉල්ලුවොත්, සර්පයෙකු දෙයි ද? මෙසේ අයහපත් ඔබ, ඔබේ දරුවන්ට යහපත් දේ දෙන්න දන්නහු නම්, ස්වර්ගයෙහි සිටින, ඔබේ පියාණන් වහන්සේ තමන්ගෙන් ඉල්ලන්නන්ට යහපත් දේ ඊටත් වැඩියෙන් නොදෙන සේක් ද?"

(මතෙව් 7:7-11)

යහපත දෙස බැලිය යුත්තේ භෞතික ව නොව ආධ්‍යාත්මික ව ය. ඔබේ ජීවිතය අර්ථවත් වන්නේ ඔබ අනෙක් අය සඳහා ජීවත් වුවහොත් පමණකි. අනුන් සඳහා ජීවත් වීමටත්, අනුන් සතුටු කිරීමටත් උදාර පෞරුෂයක් ගොඩනගා ගත යුතු ය. යහපත තුළින් සිදු විය යුත්තේ දෙවියන් වහන්සේ වෙත තව තවත් ළං වීමයි. පුද්ගලයෙක් භෞතික සැප සම්පත් තුළින් යහපත දෙස බලන්නේ නම් ඇතැම් විට ඔහු විනාශය කරා ගමන් කළ හැකි ය. එනම්, භෞතික සම්පත් ලැබීම තුළ දෙවියන් වහන්සේගෙන් ඈත්වීමට ඉඩ ඇත. මේ නිසා යහපත් දේ කුමක් ද යන්න තීරණය කරන්නේ දෙවියන් වහන්සේ ය.

**ක්‍රියාකාරකම**



1. දෙවියන් වහන්සේට අයදින අයට යහපත් දේ දනය කරන බව සනාථ කිරීමට වදාළ උපමා **දෙකක්** ලියන්න.
2. සලමොන් රජතුමා දෙවියන් වහන්සේට කළ යාච්ඤාවෙන් ඔබගේ ජීවිතයට ගත හැකි ආදර්ශ **දෙකක්** ලියන්න.
3. "අප කොපමණ යහපත් දේ ඉල්ලා යාච්ඤා කළත් දෙවියන් වහන්සේ එම ඉල්ලීම් අපට ඉටුකර දෙන්නේ නැත" යනුවෙන් පවසන ඔබේ මිතුරෙකු ධෛර්යමත් කරමින් මිතුරා නැවත යාච්ඤාව වෙත නැඹුරු කර ගන්නා අයුරු වචන 50කින් පමණ විස්තර කරන්න.

**ජීවිතයට බිඳක්**

*සෑම විට ම යහපත් දේ වෙනුවෙන් පමණක් දෙවිඳුන් යදින්න.*



නොමිලේ බෙදාහැරීම සඳහා ය.